සුන්දර-මිනිසුන් මැද

අකර්තැබ්බියක සිනිඳු පහස

මංජුල වෙත්තසිංහ

දශක තුනක කුරුටු යුද්ධයකින් දරුණු ලෙස තුවාල වූ සිතක් සහ දුබල වූ ගතක් ඇතැයි අපට පහසුවෙන් සිතිය හැකි කාලයක ශ්‍රී ලංකා මාතාවගේ දරුවෙකු ලෙස ශ්‍රී ලංකාව තුළදීම මා මුහුණ දුන් මේ සිද්ධිය ඔබ සමග බෙදා හදාගැනීම යුතු කමකෙයි මට සිතුනි.

පසුගිය දෙසැම්බරයේ දී දරු මල්ලන් සමග ශ්‍රී ලංකාවේ සති කිහිපයක් ගත කිරීමට මට යළිත් වාසනාව ලැබුනි. මවු රටට පෙරදි ගිය සෑම වාරයකම වාගේ මෙවරත් කටුනායක සිට නිවෙස බලා යන පෙර ගමනේදී සිත ගත කිළිපොලා යන වීඩියෝ ක්‍රීඩාවක් නරඹන පරිද්දෙන් වාහනය තුළ සිට මම ඉදිරි විදුරුව තුළින් මාර්ගය දෙස වික්ෂිප්තව බලා සිටියත්, මව්රට තුළදී මිය ගියත් යෙහෙකැයි සිතා සැතපුනෙමි. කෙතරම් නිදිබර වුවත් මේ ගමනේදී නින්ද නොගියේ ගමන පුරාම අත්දුටු සංහාසය, අවිනිශ්චිතභාවය, භීතිය සහ ප්‍රවේගය මුසුවූ ආවේගාත්මක ප්‍රබෝධය නිසා විය යුතුය. වසර ගණනාවක් ඕස්ට්‍රේලියාවේ ඇති ක්‍රමාන්විත මාර්ග නීති පද්ධතිය අකුරටම පිළිපැද හුරුවුනු අපේ මනසට මෙසේ ලංකාව තුළ වාහනයක ගමන්කිරීම ඇඟ කිළිපොලා යන සංසිද්ධියක් වුවත්, අපත් ලංකාවේ නිත්‍ය වාසය කල කාලය තුළ ගමන් කළේ මෙසේම නොවේදැයි සිතී මා ලැජ්ජාවට පත්වූ වාරද අනන්තය.

ලංකාවේ ගතකරන කාලය තුළදී ගමන් කිරීම සඳහා පුංචි මස්සිනා ඔහුගේ වෑන් රථය නිදහසේ සහ නොමිලේ ලබා දුන්නේ මා ගැන ඔහු තුළ ඇති අනන්ත අප්‍රමාණ විශ්වාසය සහ ආදරය නිසා මිස ඔහුගේ නැඟනිය ගැන ඇති කැක්කුමක් නිසා නොවිය යුතුය.

කෙසේ වෙතත් මේ සති කීපය තුළදී මස්සිනාගේ වෑන් රථය කුඩුපට්ටම් කරදමා රෝහල් ගතවීමට හෝ පාරේ මැදට කිට්ටු වී සුපුරුදු ලෙස පහසුවෙන් ගමන් කරනා අනෙකුත් මගීන් යටකරගෙන ගොස් මහලුළු ගෙදර තැපීමට හෝ මගේ තුන් හිතකවත් බලාපෙරොත්තුවක් නොතිබුණෙන්, "මම වාහන පැදවීමෙන් වැළකී සිටිමි" යන අතිරේක සහ තාවකාලික ශික්ෂා පදයක් මා වෙනුවෙන්ම සකසා ගතිමි.

මේ ශික්ෂා පදය පිළිපැදීමට නම් විශාල මුදලක් වැයකර කුලියට රියදුරු සමග වාහනයක් ලබාගත යුතු වුවත්, එය දරුණු වාහන අනතුරකින් ලැබිය හැකි පාඩුවට වඩා බෙහෙවින් කුඩා බැවින් කල් නොයවා රියදුරෙකු සමග "ටොයෝටා හයිලැන්ස් " වර්ගයේ වෑන් රථයක් අප සිටි ගාල්ල ප්‍රදේශයෙන්ම කුලියට ලබාගතිමි.

තුරුණු විය යන්තමින් පසුකරමින් සිටි අපේ රියදුරු සමග අප වරක් ගාල්ලේ සිට පැමිණ කොළඹ ප්‍රදේශයේ සැරිසැරුවේ දින කිපයක්ම හෝමාගම පිහිටි, අපේ හිතමිතුරන්ට අයත් නිවෙසක නවාතැන් ගනිමිනි. දිනක් සවස 6.30 පමණ වනතෙක් නුගේගොඩ සාප්පු සවාරියේ යෙදී නැවත හෝමාගම බලා යාමට රාත්‍රියේ හෝමාගමදී පැවැත්වීමට කටයුතු යොදු තිබු ජනාධිපතිවරණ රැස්වීම නිසා රථවාහන තදබදයක් ඇතිවී ගමන පමාවේදෝයි සැකයෙනි.

හයිලෙවල් පාර දිගේ ඇති අධික වාහන තදබදය අස්සේම කිලෝමීටර් භාගයක් යාමටත් පෙර, රියදුරු වාහනයේ වේගය අඩුකරන අයුරුත්, ඔහු ගියර් රිවරය සමග පොර බදන අයුරුත් වාහනයේ ගියර් පෙට්ටිය මර ළතෝනි දෙන අයුරුත් ඇසු දුටු අපි, පසුද උදෑසතින්ම මහනුවර හරහා දඹුල්ල දක්වා යාමට යොදගෙන ඇති ගමනට "දෙවියන්ගේ පිහිටයි" කියා එක එල්ලේම සිතා ගත්තෙමු.

"ක්ලච් එක පෑගෙන්නේ නෑ සර්, ගියර් එක මාරු කරන්න බෑ" රියදුරා පැමිණිලි කරමින් ගියර් ලීවරය කඩා දැමීමට උත්සාහ කල අයුරු මට තාම මතකය. "ක්ලච් පොම්ප ගිහිල්ලා " රියදුරා වාහනයේ රෝග විනිශ්චය ක්ෂණිකව අවසන් කර වෑන් රථය පසෙකට කර නැවැත්වුයේ කෙණ්ඩා පෙරළුනු ඔළිම්පික් ධාවන ශූරයෙකු පරිද්දෙනි. දෙල්කඳ හන්දියටවත් ගියහොත්, මොටර් රථ අතර කොටස් විකුණන කඩ සාප්පු සහ මෝටර් රථ කාර්මිකයින් ඇති තරම් සොයාගත හැකි බව පැවසූ ඔහු පළමු ගියරයේ තිරව් ඇති වෑන් රථය යළි පණ ගැන්වුයේ මුළු වාහනයම ඉදිරියට විසිවී යන ලෙස පිම්මක් පන්නමිනි.

"මොකද ඒ වුනේ " විසිවී ගොස් නැතිගත් මගේ බිරිඳ වික්ෂිප්තව අසුවේ, මගේ පුතා සහ දුව නම් එම විසි වීමෙන් මහත් අමන්දානන්දයට පත්වී සිටි මොහොතකය. මම බිරිඳට කරුණු පහඳ දිමි, "ක්ලච් එක වැඩකරන්නේ නැත්නම් ගියර් එක තියුටුල් කරන්න බෑ. එතකොට ස්ටාට් කරන කොට ඔහොම තමයි" . ලංකාවේද මෙය සුළු සිද්ධියක් බව මම හොඳින් දැන සිටියෙමි.

කෙසේ හෝ සෙමින් සෙමින් ඉදිරියට ඇදුණු වාහනයට විනාඩි කිහිපයකින් දෙල්කඳ ප්‍රදේශයට පැමිණුනත් මේ වන විට වේලාව සවස 7ක් පසුවී, රෑ බෝවී ගෙන එන හැටිත්, සියළුම කඩසාප්පු වසා දමා ආකාරයත් දුටු අපි මහත් කණස්සල්ලට පත් වීමු.

"මේක හදගන්න වෙන්නේ හෙට උදේ තමයි " රියදුරා කෙඳිරිගාන හඬ මට යාන්තමින් ඇසුණි . බිරිඳ ගේන් දරු දෙදෙනාත් සුන්වූ බලාපොරොත්තු මුසු වූ වදන් වලින් මගේ දෙසවන් පිරී ඉතිරි යනු මට මතකය.

අප වාහනය නැවැත් වූ තැනට ඔබ්බෙන්, රෑ බෝවන විට විවෘත වන "දුවන ගිරි" වර්ගයේ ආපන ශාලාවක වැඩකටයුතු කඩිමුඩියේ අරමඹනු දක්නට ලැබිණි. එහි උදව්වට සිටි කෙසග සිරුරැති, මැදි වයසේ යැයි සිතිය හැකි පුද්ගලයෙක් අපේ උදව්වට ඉදිරිපත් වූයේ මේ මොහොතේදීය.

"මල්ලි, මොකද ප්‍රශ්නේ" ලෙන්ගතු තමුත් සාපු හඬින් අපේ රියදුරාගෙන් ඔහු ඇසූ වාග් විලාසයේ "කිසිම ප්‍රශ්ණයක් "ප්‍රශ්ණයක් නොවේ" යන විශ්වාසනීය හැඟීමක් තිබුණ බව මට හැඟුණි . කෙසේ වෙතත්, කොළොම් පුරේ ඉපදී, හැදී වැඩුණු මට "කාක්කන්" ගැනත් හොඳ අවබෝධයක් තිබුණු බැවින්, ඉවසීමෙන් සහ සංගමයෙන් යුතුව සිදුවන්නට යන දේ බලා සිටීමට මම තීරණය කළෙමි.

වාහනයෙන් පිටතට පැමිණ රියදුරා සමග උපාලි නම් වූ මේ පුද්ගලයා "කුසු කුසු" ගාන හඬත්, උපාලි විදුලි වේගයෙන් අඳුරේම එහේ මෙහේ දුවන පතින ආකාරයත්, අසුරු සැණින් ඔහු අඩ අඳුරේම වෑන් රථය යටට රිංගා කඩේ අතේ " ක්ලච් පොම්පය" පරීක්ෂා කරන ආකාරයත් දුටු අපගේ සිත් තුළ බලාපොරොත්තු වන සේයාවන් යළි මතුවන්නට පටන් ගතී.

මටත්, බිරිඳටත් මෙය සාමාන්‍ය සිදුවීමක් වුවත් ඕස්ට්‍රේලියාවේදී මගතොටේදී කිසිදු මෙවන් ක්ෂණික ස්වේජ්ජා සේවාවක් ලබනු තියා ආසාවත් නැති දරු පැටවුන් දෙදෙනාගේ මුහුණු වල විශාල "ප්‍රශ්ණාර්ථ ඉඟුණු " මැවී ඇති ආකාරය දුටු මට ඔවුන් ගැන අනුකම්පාවක් පහළ වුනි. "ලංකාවේ ඔහොම තමයි පුතේ, මිනිස්සු අඟක බලාගෙන ඉන්නේ නෑ. ඕනෑම කෙනෙක් ඕනෑම වේලාවක ඕනෑම කෙනෙකුට කරදරයකදී උදව් කරනවා. " වික්ෂිප්තව බලා සිටි දරුවන්ට මම පහඳ දුනිමි. එය කෙසේ සිදුවිය හැකි දැයි ඔවුන්ට එතරම් තේරුම් ගියේ නැති ගානය.

සිදුවන්නට යන්නේ කුමක්දැයි, එසේත් නැත්නම් හෙට උදේ ගමන කෙසේ වෙතත්, අද රාත්‍රී නවාතැනට යාගන්නේ කෙසේදැයි දැන ගැනීමේ අටියෙන් මමද වෑන් රථයෙන් බැස අපේ රියදුරාත්, උදව්වට පැමිණි උපාලිත් අතර ඇති සුසංවාදයට එක් වුනෙමි. ක්ෂණිකවම මා දැක්කේ උපාලි විසින් මේ රෑ යාමේ "ක්ලච්" පොම්පයට අවශ්‍ය " වොෂරය" ඇළුතින් ගැනීමට හැකි ස්ථාන පිළිබඳව ඔහුගේ මතකය විවෘත කරමින් රියදුරා සමග ලෙන්ගතු කතාබහක යෙදෙන අන්දමය. මේ කතාබහ අතරතුරේ මේ පුද්ගලයා කඩිමුඩියේ පාරේ එහාට මෙහාට පනිමින්, අපේ උදව්වට විශාල මෙහෙයක් කරන ලෙසක් මට පෙණුනි. "ටොයොටා හයිලැන්ස්" වර්ගයේම තවත් වෑන් රථයත් අප අසලින්ම පාරේ එහා පැත්තේ නතර කලේ මේ මොහොතේය. "කුලියට දිම සඳහා " යැයි තරමත් විශාල ඉංග්‍රීසි අකුරෙන් පැහැදිලිව සටහන් කර තිබු ඒ වෑන් රථයේ කිහිප තැනකම කුලියට එම රථය ලබා ගැනීම සඳහා ඇමතිය යුතු දුරකථන අංකයද ප්‍රදර්ශණය කර තිබිණි.

මේ වෑන් රථයේ අයිතිකරුගේ නම නානායක්කාර බවත් ඔහු උපාලි ගේ මිතුරෙකු බවත් ඔවුන් අතර වූ කතාබහින් අපට තේරුණි. අපේ වාහනයට හෙට උදෙන්ම යාමට ඇති ගමනත් , වාහනයත්, රියදුරාත් දුර බැහැරව ගාල්ල ප්‍රදේශයේ සිට පැමිණ ඇති බවත්, එහි තුළ සිටින දරු දෙනෙ-ක්ගෙන් යුත් පවුලට මහමග රස්තියාදු විමට සිදුවීමත් මේ දෙදෙනාගේ කතාබහට ලක්වනු අපට වරින් වර ඇසුණි.

මොහොතකින් නානායක්කාර තම වාහනයට අපේ රියදුරා නැවාගෙන, උපාලි විසින් නම් කරනු ලැබ ස්ථාන කීපයකටම යාමට සැරසෙනු මට පෙණිනි. " මගත්තයා උපාලි කියනවා මේ ළඟ තැනක " ස්පෙයාර් පාට්ස්" ගන්න පුළුවන් තැනක් තියෙනවාලු. මම නානායක්කාරත් එක්ක ගිහිං බඩු හොයාගෙන එන්නං " රියදුරාගේ ඉල්ලීමට අවසර දෙනු හැර වෙන විකල්පයක් මට නොතිබිනි.

මේ වනවිට රාත්‍රී 8ත් පසු වී තිබුණත්, බඩගින්න මිස තිතේ ගින්දරක් නම් නොවුයේ අප මේ ඉන්නේ උපන් , හැදුනු වැඩුනු රටේ නිසා වෙන්නට ඇත.

රියදුරා පිටත්වීමත් සමගම අප වෙත පැමිනි උපාලි, "නෝනා, දරුවොත් එක්ක ඇවිත් මෙතන වාඩි වෙලා ඉන්න, වෑන් එක අතුලේ හිරවෙලා ඉන්න අමාරුනේ " මගේ බිරිඳට ආරාධනා කලේ " දුවන ගිරිය" අසළ අපුරුවට අටවා තිබු විශාල කුඩයකින් ආවරණයව ප්ලාස්ටික් පුටු හතරක දෙසට අත දිගු කරමිනි. මේ පුටු ඔවුන්ගේ " දුවනගිරි" යෙන් කෑම මිලදී ගන්නා පාරිභෝගිකයින් සඳහා තබා ඇති බව අපට පෙනුනි. ඒවායේ වාඩිවී ඔවුන්ගේ ව්‍යාපාරයට බාධා කිරීම වැරදි සහගත බැවින් අප එම ඉල්ලීමට කාරුණිකව ප්‍රතික්ෂේප කලත් ඔවුන්ගේ බලවත් පෙරැත්ත කිරීම හමුවේ, අවසානයේ අපි ඒවායේ අසුන් ගනිමු.

ඕස්ට්‍රේලියාවේ නගරබද කඩසාප්පු අසල එලිමහනේ නවින ලෙස සාදු ඇති "කැන්වස්" කුඩ සහ ඒ යටින් දිලිසෙමින් අපුරුවට තබා ඇති මල නොකන වානේ වලින් තැනූ එළිමහන් පුටු සකසා ඇති ආකාරයට මට සිහිවුණි. වෙනස වූයේ ආම්පන්න වල තිබු පරාණකම , මළකඩ සහ දුවිල්ලෙන් යුතුවීම හැර ඒවායින් වූ සේවය නොවේ. අනෙක් කැපී පෙනෙන ලක්ෂණය වූයේ වැඩි සෙනගක් කොහෙත්ම නැති නමුත් බෙහෙවින් රථවාහන පිරි මාර්ගය අයිනේ , පාළු පෙදෙසක මෙම කුඩය සහ පුටු තබා ඒ අසලින් "ජංගම හෝටලය" තබා තිබීමත්ය.

මෝටර් රථ වලින් පැමිනෙන නොයෙක් දෙනා මේ ජංගම හෝටලයෙන් ආහාර මිලදී ගෙන ක්ෂණිකව ඉගිලී යන හැටි අපි බලා හිටියේ ජංගම හෝටලය තුළ තිබු ඉඳි ආප්ප, පාන්, පිට්ටු, තෝසේ වැනි නානාප්‍රකාර කෑම වර්ග අපේ බඩ පුණුවන්ට සෙනෙහසින් ආරාධනා කරදිදිය. ජංගම හෝටලයේ අයිතිකරු හෝ එහි උදව්වට සිටිනා උපාලි හෝ අපට කෑම මිලදී ගැනීම සඳහා කිසිම ඉල්ලීමක් හෝ බලපෑමක් නොකළත් ඔවුන්ගේ "දුවන ගිරි" යේ තිබු කෑම වර්ගවල දර්ශණයත්, ඒවායෙන් ආ ප්‍රණීත සුවඳත් ඒ කර්තව්‍යය පුලපුලා ඉටුකල බව පමණක් මට මතකය.

පැය භාගයකට පමණ පසු, පුංචි දියණියගේ බලවත් ඉල්ලීම අපේ නිදහසට කරුණක් කරගෙන, අපි සෑම ඒ "දුවන ගිරි" යෙන්, උණු උණුවේ හතරට කැපූ පාන් ගෙඩියකුත්, කෙළ බේරෙන හාල්මැස්සන් හොඳ්දකුත් මිලදී ගෙන, කාලයකට පසු කෑ "හොඳම " කෑම වේලක රහ, රෑයාමේ"හඳපානේ "පාර අයි-නේ ඉඳගෙන වින්දෙමු. එය අප සැමටම විශේෂයෙන්ම දරු දෙදෙනාට නවතම සහ අපූර්වතම අත්දැකීමක් වූ බව නිසැකය.

සුළු වේලාවකින් නානායක්කාරත්, අපේ රියදුරාත් ආපසු පැමිණියේ බලාපොරොත්තු රහිත ලෙස හිස් අතිනි. බඩකට මෙන්ම බලාපොරොත්තුත් පිරි තිබුණු අපට මෙය ඉමහත් කළකිරීමක් විය.

නානායක්කාර අපේ රියදුරාට අමුතුම තාලේ යෝජනාවක් නෙනෙවේ මෙවිටය. "මල්ලි, මගේ වාහනෙන් "හයිලැන්ස්" ඔයාගේ වෑන් එකේ මොඩල් එකමයි. මං ඉන්නේ මේ කිට්ටුව, මහරගම. ඔහොම ෆස්ට් ගියර් එකේම අපේ ගෙදර යං. මං මගේ වෑන් එකේ පොම්පේ ගලවලා ඔයාගේ එකට හයිකරලා දෙන්නං. ඊට පස්සේ මල්ලිගේ ගමන මල්ලි යන්න. මම හෙට උදෙන්ම කඩ ඇරියම මගේ වෑන් එකට පොම්පයක් හයිකර ගන්නං"

සති ගණනාවක් ලංකාවේ ඉඳ සිංහල භාෂාව තවත් හොඳින් "ප්‍රගුණ" කර සිටි අපේ පුතාට මේ කතාව හොඳින් තේරුණි. ඔහු වික්ෂිප්තව වී ගොසින්ය. කොටින්ම පුතා පමණක් නොව මාද "කරකවා අතහැරියා" ගානය. මමත්, බිරිඳත් මුව අයාගෙන මුහුණට මුහුණ බලා සිටියෙමු.

"මෙවන් දේ සත්‍යයෙන්ම සිදුවිය හැකිද? " මගේ සිත හැඟීමෙන් බරවී යද්දී, අපේ රියදුරාට "කට උත්තර" නැත. "මේ ඉල්ලීම එකග වී අපි සතුටින් ගෙදර යන්නේ කෙසේද? එවිට හෙට දවසේ නානායක්කාර ඔහුගේ බඩ වියත සොයා ගන්නේ කෙසේද? අපි උපන් ලංකාව උතුම් රටක් වුවත්, මේ තරමටම උතුම් රටක්ද? " අපි ප්‍රශ්ණ වැළක පැටළී සිටියෙමු.

"යං යං " නානායක්කාර බලකරන අතරතුරේ බිරන්න වී සිටි අප අපගේ නිශ්ශබ්දතාවය බිඳීමට පැමිණියේ උපාලිය. "මල්ලි මම දැං කෝල් කරලා බැලුවා. නව තැනක් තියෙනව. ඒතනනං ෂුවර් එකට බඩු තියෙනවා. කඩේ එළියෙන් වහලා. හැබැයි අයිතිකාරයා උඩතට්ටුවේ ඉන්නවා. ටක් ගාලා ගිහිං බඩු ගන්න ", නව පණක් ලැබූ අපේ රියදුරා නානායක්කාර සමග නැවතත් පිටත් වුයේ පියඹා ගෙන මෙනි.

විනාඩි විස්සකින් පමණ අපේ රියදුරාත්, නානායක්ක-ාරත් යළි පැමිනියේ සිනාමුසු මුහුණිනි. "වොෂර්" පමණක් නොව මේ රෑ නවයක් පසුවී, ඒවා සවිකර දිය හැකි කාර්මිකයෙකු සිටින තැනද සොයාගෙන මේ අය පැමිණියේ බාගෙට මැරී තිබු " හෙට උදේ ගමන" ට නව පණක් දෙමිණි.

උපාලිටත්, නානායක්කාරටත්, බෙහෙවින් සැතුටින්ම වූ අපි පළමු ගියරයේ තිරවී ඇති අපේ වෑන් රථය යළිත් "පිම්මේ පන්නා" පණගන්වා, සෙමෙන් සෙමෙන් මෝටර් රථ කාර්මිකයා සිටින තැන සොයා ගියෙමු.

රාත්‍රී 10 ත් පසුවී තිබු මේ යාමයේ, තරුණ පාහේ කොළු ගැටයෙකු සේ පෙණුන කාර්මික ශිල්පියා එළිලා හැලෙන ගේට්ටුව විවෘත කර අපව පිළිගන්නේ විශාල කැමැත්තකින් නොවුවත්, අප පැමිණොත බව කල්තියා ඔහුට නානායක්කාර විසින් දුරකථනයෙන් දන්වා තිබුණු බව අපට දැනුණි.

ගරාජයේ පොළව බඳම කර නොතිබුණු අතර ආයුධ ආම්පන්න, අමතර කොටස්, පරණ ටයර් ආදිය බිම සෑම තැනකම "ක්‍රමානුකූලව" විසිරී තිබිණ. මළක කෑ තඹවු වහලකින් යුතු වූ මේ ගරාජයේ නඩත්තුව හෝ අලුත්වැඩියාව සඳහා ගෙනවුත් තිබු පරණ වාහන තුනක් පමණ නවත්වා තිබුණි.

මීට කලින් කිසි විටෙකත් දැන හැඳින නොසිටි අපේ රියදුරාට "මචං" කියා ආමන්ත්‍රණය කිරීමෙන්, අප විසින් ඔහුගේ සැපවත් රාත්‍රිය කොල්ලකා ගැනීම ගැන කාර්මික ශිල්පයාගේ සිතේ "කහටක්" නොමැති බව හොඳින් නිරූපණය විණ. වැඩි කතාබහක් නොකළ ඔහු වාහනය යට රිංගා, රියදුරු අසුනේ සිටි අපේ රියදුරාට දෙන නොයෙක් විධානයන් අසා පුතාත්, දුවත් කුල්මත් වෙනු මම දුටිමි. "පාගන්න", "අත හරින්න" , "ආයෙත් පාගන්න" ආදී වශයෙන් නොකඩවා ගලා ආ විධාන වැලේ අතරින් පතර "හයියෙන් පාගපන්" කියාත්